**ශීර්ෂය - 11 - මුදල් කොමිෂන් සභාව**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මතය

**------**

මුදල් කොමිෂන් සභාවේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබදවමාගේ අදහස් දැක්වීම් හානිරික්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2022 ජූනි 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට  මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන්විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාව  විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්**,** වියදම්**,** වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීදැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 වියදම් කළමනාකරණය**

**--------------------------**

| **විගණන නිරීක්ෂණය**<br>---------------------- | ප්‍රධාන ගණකාධිකාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------- | **නිර්දේශය**<br>----------- |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් හා කොරෝනා වසංගත තත්ත්වය හමුවේ වියදම් අවම වීම හේතුවෙන් එක් පුනරාවර්තන වැය විෂයයක රු.600,000 ක්වූ සම්පූර්ණ ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණු අතර මූලධන වැය විෂයයන් 02 ක එකතුව රු.600,000 ක්වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. තවත් මූලධන වැය විෂයයක මුළු ප්‍රතිපාදනයෙන් සියයට 97 ක් එනම් රු.970,908 ක් ඉතිරිවී තිබුණි. | 2021 වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී විදේශ අවස්ථා සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවත් කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් වැය 1102 රි තිපාදනයම ඉතිවිෂයෙහි ශුද්ධ ප්‍ර .විය රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා රජය විසින් ලබාදුන් උපදෙස් අනුව අත්‍යවශ්‍ය නොවන වියදම් කල් දැමීමට සිදුවිය සහ සූත්‍රතවද යන්ත්‍ර . ගොඩනැගිලි භාවිතය සීමාසහිත 2001 වීම නිසා වැය විෂයය අංක වැය විෂයෙහි 2002 සහ .තිපාදන ඉතිරි වියසම්පූර්ණ ප්‍ර 2021 වර්ෂයේ සැලසුම් කළ පුහුණු වැඩසටහන් බොහොමයක් රටේ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකිවීම හේතුවෙන් හි 2401 .තිපාදන ඉතිරි වියප්‍ර | වියදම් ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ජ)(4) ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්යයන් ලෙස පළාත් සඳහා වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදාදීමේ ප්‍රතිපත්ති සහ පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් යොමු කරන ලද කරුණු සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම දක්වා තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් එම කාර්යයන් සම්බන්ධයෙන් 154 (ජ) (6) ප්‍රකාරව ස්වකීය කාර්ය පටිපාටිය තීරණය කළ යුතු වුවත් එවැන්නක් සකස් කරගෙන නොතිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මුදල් කොමිෂන් සභාවට පැවරුනු කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියා පිළිවෙලක් සකස් කරගෙන ඇත. වාර්ෂිකව සිදු කරන වෙනස්කම් සිදු කරමින් එම ක්‍රියා පිළිවෙලට අනුව කොමිෂන් සභාව සිය කාර්යයන් ඉටු කරනු ලබයි. | ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවේ 154 (ජ) (6) ව්‍යවස්ථාව ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2018 වර්ෂය ආරම්භ කර තිබුණු කොමිෂන් සභා පනත සකස් කිරීම සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අවසන් කර නොතිබුණි. | ඉදිරියේදී සිදුවිය හැකි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුවමේ ගැන සලකා බැලිය හැකි බවද එතෙක් පසුගිය වර්ෂ 30 කට අධික කාලයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදී ඇති ප්‍රතිපාදන තුල කටයුතු කරගෙන ආ ආකාරයට ඉදිරියට කරගෙන යා හැකි බවද නව සභාපතිතුමන්ගේ අදහසයි. | පනත සකස් කිරීමේ කටයුතු සිදු කළ යුතු වීම |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **-----------------------** | **--------------------------------------** | **------------** |
| සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක්, තෘතීයිය මට්ටමේ පුරප්පාඩු 02 ක්, ද්වීතියික මට්ටමේ පුරප්පාඩු 07 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 08 ක් පැවති අතරඑම පුරප්පාඩු පිරවීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා ද්වීතියික මට්ටමේ පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස කිහිපවිටක්ම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කළද ඒ සඳහා නිලධාරීන් එවා නොමැති අතර එය අපගේ පාලනයෙන් බැහැර වූ කරුණකි.<br>ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සඳහා බහු කාර්ය සංවර්ධන කාර්ය සාධන බලකාය මඟින් පුහුණුවට නිලධාරීන් 07 ක් යොමු කර ඇති අතර අදාල පුහුණුව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එම බලකාය විසින් ඔවුන් මෙම ආයතනයට අනුයුක්ත කරනු ලබන බව දන්වා ඇත. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |